2015 ඔක්තෝබර් මස 13 වැනිදා අඟහරුවාදා | දිවයින

## මාරුවීම් ලද වෛද්‍යවරුන් නොපැමිණීමෙන්

# දුෂ්කර ප්‍රදේශවල දොස්තර හිඟය උග්‍රවේ

අජිත් අලහකෝන්

**ස්ථාන මාරුවීම් ලද වෛද්‍යවරුන් එක්දහස් එකසිය හැට හත්දෙනකු (1167) 2012 වසර සිට 2014 වසර දක්වා කාලය තුළ එම මාරුවීම් ක්‍රියාත්මක නොකර නගරබද ප්‍රධාන රෝහල්වලට වී සිටීම නිසා ගම්බද දුෂ්කර ප්‍රදේශවල වෛද්‍ය හිඟය දිනෙන් දින ඉහළ යමින් තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රකාශකයෙක් 'දිවයින'ට කීවේය.**

මෙම වෛද්‍යවරුන්ට අදාළ ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම රෝහල් අධ්‍යක්ෂවරුන්ට නියෝග කළද එම අධ්‍යක්ෂවරුන් අදාළ නියෝග නොතකා කටයුතු කරන බව ද ඉහත ප්‍රකාශකයා 'දිවයින'ට කීවේය.

ස්ථාන මාරුවීම් ලැබ එහෙත් ඒවා ක්‍රියාත්මක වෛද්‍යවරුන් අතර කොළඹ ජාතික රෝහලේ වෛද්‍ය නිලධාරීන් 106 ක්, මහනුවර ශික්ෂණ රෝහලේ වෛද්‍ය නිලධාරීන් 93 ක්, මහරගම පිළිකා රෝහලේ වෛද්‍ය නිලධාරීන් 49 ක් සිටින බවද ඉහත ප්‍රකාශකයා පැවැසුවේය.

මෙම වෛද්‍යවරුන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයන් ද නොතකා හරිමින් 2012 වසරේ සිට ස්ථාන මාරුවීම ක්‍රියාත්මක කිරීම. මගහරිමින් සිටින අතර 2015 වසරේ ද මේ හා සමාන වෛද්‍යවරුන් පිරිසකට ස්ථාන මාරුවීම් ලැබී ඇතැයි ද කීය.

අප මේ පිළිබඳ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයෙන් විමසූ විට එහි ලේකම් වෛද්‍ය නලින්ද හේරත් මහතා ප්‍රකාශ කර සිටියේ වෛද්‍ය පරිපාලකයන් කිහිපදෙනකු විසින් 2012, 2013 සහ 2014 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක නොකරන බව දක්නට ලැබෙන බවය.

මෙම මාරුවීම් නියෝග රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග බව රෝහල් අධ්‍යක්ෂවරුන් තේරුම්ගත යුතු බව ද කී වෛද්‍ය හේරත් මහතා මාරුවීම් ප්‍රතිපත්තිය උල්ලංඝනය කරන අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කිරීමට වෛද්‍ය නිලධාරීන්ගේ නියමය කටයුතු කරන බවද කීවේය. එමගින් වෛද්‍ය පුරප්පාඩු ඇති රෝහල්වලට සහනයක් ලැබෙනු ඇතැයි තම සංගමය විශ්වාස කරන බව ද හෙතෙම කීවේය.